සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

14.02.2024

Learning Resource Centre
De Mazenod College
Kandana

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි
- 1 කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. පහත දැක්වෙන පෘෂ්ඨවංශී සත්ත්වයින් අතරින් තම ජීවන චක්‍රයේ දී රූපාන්තරණයක් පෙන්වන සත්ත්ව විශේෂය වන්නේ,
    1. මීයා ය. 2. අශ්වයා ය. 3. ගෙම්බා ය. 4. නාගයා ය.

02. ලිපිඩ අඩංගුවන ආහාරමය උපස්ථරයක් මත ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරිත්වය හඳුන්වන්නේ,
    1. මුඩුවීම නමිනි. 2. පැසීම නමිනි. 3. පූතිභවනය නමිනි. 4. විජලනය නමිනි.

03. භූගත කඳන් පමණක් අඩංගුවන පිළිතුර තෝරන්න.
    1. කහ, බතල, ඉඟුරු 2. අර්තාපල්, ළූණු, ඉඟුරු
    3. කහ, බතල, අර්තාපල් 3. ඉරිඟු, ළූණු, අර්තාපල්

04. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් සංයෝගයෙහි අඩංගු වන මූලද්‍රව්‍යයන් වන්නේ,
    1. සෝඩියම්, හයිඩ්‍රජන්, සල්ෆර් 2. සෝඩියම්, ඔක්සිජන්
    3. සෝඩියම්, ක්ලෝරීන්, ඔක්සිජන් 4. සෝඩියම්, හයිඩ්‍රජන්, ඔක්සිජන්

05. A මැස්සාගේ ගුමු ගුමු නාදය ඇතිවන්නේ පියාපත් වේගයෙන් සැලීම නිසාය.
    B සයිලපෝනයක හඬ නිකුත් වන්නේ වායු කඳක් කම්පනය වීම නිසාය.
    C සංගීත නාද රිද්මයානුකූල වන අතර ඝෝෂාවන් අක්‍රමවත්ය.

    ඉහත ප්‍රකාශ තුන අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
    1. A හා B පමණි. 2. B හා C පමණි. 3. A හා C පමණි. 4. B පමණි.

06. රූපයේ දැක්වෙන චුම්බක වර්ගය හඳුන්වන නම කුමක්ද?
    1. දණ්ඩ චුම්බක
    2. අශ්වලාඩම් චුම්බක
    3. වලයාකාර චුම්බක
    4. පෙති චුම්බක




07. රසායනික විපර්යාසයක් සිදු වූ බව පෙන්නුම් කරන්නේ පහත කවර පිළිතුරෙහිද?
    1. ලෝහයක් කැබලිවලට කැඩීම. 2. ජලය වාෂ්ප බවට පත්වීම.
    3. ගිණිකූරක් දහනය වීම. 4. ඝන ඉටි කැබැල්ල ද්‍රව බවට පත්වීම.

08. රූපයේ දැක්වෙන්නේ භාෂිත මිහිරංග විසින් විද්‍යාගාරයේ දී සකස් කරන ලද විද්‍යුත් පරිපථයකි. මෙහි A,B,C පිළිවෙලින් ගත්විට,




1. බල්බය, ස්විචය, වියළිකෝෂය
2. වියළිකෝෂය, බල්බය, ස්විචය
3. ස්විචය, බල්බය, වියළිකෝෂය
4. බල්බය, වියළිකෝෂය, ස්විචය

09. ජල අංශු සාන්ද්‍රණය වැඩි ස්ථානයක සිට ජල අංශු සාන්ද්‍රණය අඩු ස්ථානයක් දක්වා අර්ධ පාරගම්‍ය පටලයක් හරහා ජල අංශු ගමන්කිරීම හඳුන්වන්නේ,
1. ආස්‍රැතිය නමිනි.
2. විසරණය නමිනි.
3. ස්කන්ධ ප්‍රවාහය නමිනි.
4. උත්ස්වේදනය නමිනි.

10. සත්ත්ව විශේෂය හා ඔවුන් අයත් සත්ත්ව කාණ්ඩය නිවැරදි ව දක්වා ඇති වරණය කුමක් ද?
1. වවුලා - ආවේස්
2. ගෙම්බා - පිස්කේස්
3. තල්මසා - පිස්කේස්
4. පොළඟා - රෙප්ටීලියා

11. මුත්‍රාශයේ තාවකාලිකව ගබඩාවන මුත්‍රාවල අඩංගු සංඝටකයක් නොවන්නේ,
1. යූරියා ය.
2. කාබන්ඩයොක්සයිඩ් ය.
3. යූරික් අම්ලය ය.
4. ලවණ වර්ග ය.

12. මෙම රූපයේ දක්නට ලැබෙන ධාරාව පාලනය කිරීමට යොදාගන්නා උපාංගය වන්නේ,



1. ආලෝක සංවේදී ප්‍රතිරෝධකයකි.
2. විචල්‍ය ප්‍රතිරෝධකයකි.
3. ආලෝක විමෝචක ඩයෝඩයකි.
4. ධාරා නියාමක ඩයෝඩයකි.

13. ආහාර වර්ණකයක් මෙන්ම ප්‍රතිඔක්සිකාරක ආකලන ද්‍රව්‍යයකට උදාහරණයකි,
1. ග්ලූකෝස්
2. සැකරින්
3. පෙක්ටින්
4. කැරොටින්

14. රාත්‍රී අහසේ දක්නට ලැබෙන දීප්තිමත්ම තාරකාව අයත්වන තරු රටාව වන්නේ,
1. මහබල්ලා ය.
2. මහවලසා ය.
3. කුඩාවලසා ය.
4. ඔරායන් ය.

15. නිරිත දිග මෝසම් සුළං සක්‍රීය වීමෙන් ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන කාලසීමාව වන්නේ,
1. නොවැම්බර් සිට පෙබරවාරි දක්වා ය.
2. මාර්තු සිට අප්‍රේල් දක්වා ය.
3. මැයි සිට සැප්තැම්බර් දක්වා ය.
4. සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා ය.

16. සම්මත වායුගෝලීය පීඩනය යටතේ දී ගුරුක විසින් සංශුද්ධ ජලයේ තාපාංකය මනින ලදී. එම අගය වන්නේ,
1. $100^0$C
2. $0^0$C
3. $30^0$C
4. $37^0$C

17. දීප්තිමත් දැල්ලක් සහිතව දහනය වී සුදු පැහැති කුඩක් ඉතිරි වන ලෝහමය මූලද්‍රව්‍ය වන්නේ,
1. සල්ෆර් ය.
2. මැග්නීසියම් ය.
3. කොපර් ය.
4. අයිඩින් ය.

18. භූ ස්ථායි චන්ද්‍රිකා ජාලයක් පිහිටුවා මුළු ලොවම විශ්ව ගම්මානයක් බවට පත් කිරීමේ අදහස මුල්වරට ලොවට ඉදිරිපත් කළ විද්‍යාඥයා වන්නේ,
1. යූරිගගාරින් ය.
2. ගොඩාඩ් ය.
3. සියෝල්කවුස්කි ය.
4. ආතර් සී ක්ලාක් ය.

19. දෙබරුන් දෂ්ට කළ විට ඇතිවන වේදනාව සමනය කිරීම සඳහා දෂ්ට කළ ස්ථානයේ ආලේප කිරීමට වඩාත්ම සුදුසු ද්‍රාවණය වන්නේ,
1. ග්ලූකෝස් ය.
2. හුණු ය.
3. විනාකිරි ය.
4. ලුණු ය.

20. පහත දක්වා ඇති පරිපථ හතර අතරින් බල්බ ශ්‍රේණිගතව පමණක් ම සම්බන්ධ කර ඇති පරිපථය කුමක් ද?



1



2



3



4

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

01. A. සමන් තම මව සමග වෙළඳපොළට ගොස් පහත සඳහන් වන ආහාර මිලදී ගන්නා ලදී.

(එළවළු / මාළු / බිත්තර / දෙහි / ජෑම් බෝතලය / ඉඟුරු / සහල් / සීනි)

ඉහත ද්‍රව්‍ය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. වියළි වැලියට බහා තැබීමෙන් පරිරක්ෂණය කළ හැකි ආහාර වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. එළවළු අතර තිබූ කරවිල පරිරක්ෂණය සඳහා යොදාගත හැකි ක්‍රමයක් ලියන්න. (ලකුණු 01)

iii. මාළු පරිරක්ෂණය සඳහා යොදාගත හැකි සාම්ප්‍රදායික ක්‍රමයක් නම් කරන්න. (ලකුණු 01)

iv. ආහාර පරිරක්ෂණය කිරීමේ ඇති වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

v. වෙළඳපොළෙන් ගෙනා ජෑම් බෝතලයේ ලේබලය මත සඳහන් විය යුතු වැදගත් තොරතුරු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

vi. සාන්ද්‍රීකරණය කළ ආහාරයක් කල් තබා ගත හැකි වීමට හේතුව කුමක් ද? (ලකුණු 02)

B. i. රූපයේ දැක්වෙන ඇටවුම සකසා පැයකට පමණ පසු නිරීක්ෂණය කළ විට දක්නට ලැබෙන්නේ කුමක් ද? (ලකුණු 01)

ii. මෙම අවස්ථාවේ දී සිදුවූ ක්‍රියාවලිය කුමක් ද? (ලකුණු 01)

iii. මෙම ඇටවුමේ අර්ධ පාරගම්‍ය පටලයක් ලෙස ක්‍රියා කළ ව්‍යුහය කුමක් ද? (ලකුණු 01)

iv. බින්දුදය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

v. බින්දුදය හා උත්ස්වේදනය අතර ඇති වෙනස්කමක් ලියන්න. (ලකුණු 01)




02. A. 8 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් පිරිසක් විද්‍යාව ගුරුතුමා ද සමගින් කුඩා වනාන්තර භූමියක ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය. එහි දී හඳුනාගත් ශාක හා සතුන් කිප දෙනෙක් පහත දැක්වේ.

- සමනලයා
- වැටකෙයියා
- නුග
- කටුස්සා
- අක්කපාන
- ගැඩවිලා
- වවුලා
- ගැරඬියා
- ගෙම්බා

i. පහත සඳහන් එක් එක් ලක්ෂණ පෙන්නුම් කරන ජීවියා තෝරා ලක්ෂණය ඉදිරියෙන් ලියන්න.

a. කරුමුල් දක්නට ලැබීම.
b. ජීවන චක්‍රයේ එක් අවධියක් ජලයේ ගත කිරීම.
c. බාහිර කන්පෙති සහිත කන් තිබීම.
d. සංචරණය සඳහා ගාත්‍රා ඇති, කොරල සහිත වියළි සමක් තිබීම.
e. ශාක පත්‍ර වර්ධක ප්‍රචාරණය මගින් නව ශාක බිහි කිරීම.
f. සන්ධි සහිත උපාංග ඇති බැවින් සන්ධිපාදිකයෝ ලෙස හැඳින්වීම. (ලකුණු 06)

B. ශාක වනාහි වනාන්තරයක සිටින ස්වයංපෝෂී ජීවීන් වන අතර වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් වායුව අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගෙන ප්‍රභාසංශ්ලේෂණය සිදුකරයි.

i. ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලියට දායක වන අනෙක් අමුද්‍රව්‍ය කුමක් ද? (ලකුණු 01)

ii. ආලෝක ශක්තිය අවශෝෂණය කරන්නේ ශාක පත්‍රවල අඩංගු කුමන වර්ණකය ද? (ලකුණු 01)

iii. ප්‍රභාසංශ්ලේෂණයේ දී ශාක පත්‍ර තුළ නිෂ්පාදනය වන ප්‍රධාන ඵලය කුමක් ද? (ලකුණු 01)

iv. අතුරුඵලය ලෙස පිටවී යන ඔක්සිජන් වායුව හඳුනා ගැනීමට විද්‍යාගාරයේ දී කළ පරීක්ෂණයක පියවර ලියා නිරීක්ෂණය සටහන් කරන්න. (ලකුණු 02)

03. A. දහනයට මෙන්ම මලින වීම සඳහා ද ඔක්සිජන් වායුව අවශ්‍ය වේ.
රූපයේ ඇති ඉටිපන්දම් දැල්ල හොඳින් නිරීක්ෂණය කරන්න.




i. ඉටිපන්දම් දැල්ලේ A, B, C, D කලාප නම් කරන්න. (ලකුණු 02)

ii. ඉටි වාෂ්ප දක්නට ලැබෙන්නේ මින් කුමන කලාපය තුළ ද? (ලකුණු 01)

iii. ලෝහමය උපස්තරයක් මලින වීමට අවශ්‍ය වන සාධක දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

B. මානව දේහයේ බහිස්‍රාවය සිදුකරන ඉන්ද්‍රිය තුනකි. එවායින් ප්‍රශ්වාස වාතය, මූත්‍රා, දහදිය ලෙස බහිස්‍රාවී ද්‍රව්‍ය පරිසරයට බැහැර කරයි.

i. ප්‍රශ්වාස වාතය බැහැර කරන ඉන්ද්‍රිය කුමක් ද? (ලකුණු 01)

ii. ජලය හා ලවණ හැරුණු කොට මූත්‍රා වලින් පිට කෙරෙන වෙනත් ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ලකුණු 02)

iii. මූත්‍රා ගල් ඇතිවීම සඳහා බලපාන හේතුන් දෙකක් ලියන්න. (ලකුණු 02)

iv. මධ්‍ය ස්නායු පද්ධතියේ ආරක්ෂාව සඳහා අස්ථිමය ව්‍යුහයක් ඇත. මීට අමතරව ඇති විශේෂිත පටල වර්ගය සඳහන් කරන්න. (ලකුණු 01)

04. A. මැයි, ජූනි මාසවල දී රාත්‍රී 8.00 ට පමණ අහසේ දක්නට ලැබෙන තරු රටා කිහිපයක් රූපයේ දැක්වේ.



i. මෙම තරු රටාවන් අතරින් ඔබ විසින් හඳුනාගත් තරුරටා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. රෙගියුලස් (Regulus) නම් තාරකාව ඇත්තේ කුමන තරු රටාවේ ද? (ලකුණු 01)

iii. දකුණු කුරුසිය ආසන්නයේ වම් පස ඇති දීප්තිමත් තරු යුගලයෙන් තරු රටාවට වඩා ඈතින් පිහිටන තාරකාව කුමක් ද? (ලකුණු 01)

B. පුරාතනයේ සිටි සංගීතඥයින් භාවිත කළ සංගීත භාණ්ඩ දෙකක් පහත රූපවල දැක්වේ.



A



B

i. කම්පනය වන කොටස අනුව ධ්වනිය නිපදවීම සිදුකරන සංගීත භාණ්ඩ අතරින් මෙහි දක්වා නැත්තේ කවර සංගීත භාණ්ඩ වර්ගය ද? (ලකුණු 01)

ii. මිනිස් කනෙහි ශ්‍රව්‍යතා සීමාව කොපමණ ද? (ලකුණු 01)

iii. දී ඇති සරසුල් දෙක අතරින් වැඩි සංඛ්‍යාතය ඇත්තේ කුමන සරසුලට ද? (ලකුණු 01)




C. ශ්‍රී ලංකාවට බලපෑ හැකි ස්වභාවික ආපදා අතරින් ගංවතුර තර්ජන හා නාය යෑම් බහුලව ඇත.

i. ශ්‍රී ලංකාවේ නාය යෑම් අවධානමට ලක්වී ඇති ප්‍රදේශ පිහිටන දිස්ත්‍රික්ක 2 ක් ලියන්න. (ලකුණු 02)

ii. ජලගැලීම් හේතුවෙන් ජන ජීවිතයට ඇතිවන බලපෑම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

05. A. රූපයේ දැක්වෙන්නේ විද්‍යා ප්‍රදර්ශනයක් සඳහා කවිජ චාරුක නිර්මාණය කළ විද්‍යුත් පරිපථයකි.




52429

i. මෙම පරිපථයේ A හා B විද්‍යුත් උපාංග නම් කරන්න. (ලකුණු 02)

ii. විද්‍යුත් පරිපථයට වියළි කෝෂ යුගලය සම්බන්ධ කර ඇත්තේ ශ්‍රේණිගතව ද / සමාන්තරගතව ද? (ලකුණු 01)

iii. පරිපථයේ ස්විචය සංවෘත (ON) කර විදුලි ආලෝකයක් A උපාංගය වෙතට යොමු කළ විට ලැබෙන නිරීක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

iv. ඉහත නිරීක්ෂණ ලැබීමට හේතුව කුමක් ද? (ලකුණු 01)

B. දී ඇති සටහන ඇසුරින් පිළිතුරු සපයන්න




i. A හා B අවස්ථා දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ගොයම් මැස්සාගේ ජීවන චක්‍රය මෙම ජීවන චක්‍රය හා සමාන වේ ද / නොවේ ද? ඔබේ පිළිතුරට හේතුව පහදන්න. (ලකුණු 02)

iii. ජීවීන්ගේ ජීවන චක්‍ර අධ්‍යයනයේ එක් වැදගත් කමක් ලියන්න. (ලකුණු 01)

06. A. රූපයේ දැක්වෙන්නේ ගිනිකූරු සහිත කැකෑරුම් නළයකට සවිකළ බැලූනයකි. එහි පතුලට සමීපයෙන් රත්කිරීමක් සිදුකෙරේ.




i. එය රත්කරන විට දක්නට ලැබෙන නිරීක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. රත්කිරීමට පෙර හා පසු මෙම ඇටවුමේ ස්කන්ධය පිළිබඳ ව ඔබට කුමක් කිව හැකි ද? (ලකුණු 01)

iii. යම් ස්ථානයක රසායනික ප්‍රතික්‍රියාවක් සිදුවූයේ දැයි හඳුනාගැනීමට අදාළ වන සාක්ෂි දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

B. වලාකුළක සිට පොළොවට විදුලි ආරෝපණ පැනීමක් අකුණු ගැසීමේ දී සිදුවේ. එය ස්ථිති විද්‍යුත් ආරෝපණ ආශ්‍රිතව සිදුවන ස්වභාවික සංසිද්ධියකි.

i. අකුණු ඇතිකරන වලාකුළක ආරෝපණ වෙන්ව පිහිටන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 02)

ii. අකුණු ඇතිවන මොහොතක ඔබ විසින් නොකළ යුතු කරුණක් සඳහන් කරන්න. (ලකුණු 01)

iii. ස්ථිති විද්‍යුත් ආරෝපණ හමුවේ ඔබේ සමේ රෝම සෘජුවීමක් සිදුවනු ඔබ අත්දැක ඇත.

a. මිනිස් සමේ ප්‍රධාන ස්තර දෙක නම් කරන්න. (ලකුණු 02)

b. සමේ රෝම ආශ්‍රිතව හමුවන ග්‍රන්ථියක් නම් කරන්න. (ලකුණු 01)

14.02.2024 G-8
Science

**07. A.** හිස් තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(මිශ්‍රලෝහය / සුෂුම්නා / සම්පූර්ණ / එල්නිනෝ / පෝලාරිස්)

i. කුඩා වලසා තරු රටාවේ වල්ගය අග කෙළවර දක්නට ලැබෙන තාරකාව ..........................නම් වේ

ii. සමනලයා මෙන්ම ගෙමැස්සා ද.................................. රූපාන්තරණයක් පෙන්වන කාමීන් දෙදෙනෙකි.

iii. මිනිස් දේහයේ පර්යන්ත ස්නායු පද්ධතියේ ඇති .......................... ස්නායු යුගල් ගණන 31කි.

iv. නික්‍රෝම් යනු ඉහළ ප්‍රතිරෝධකතාවයක් සහිත ................................... කි.

v. නියඟයක් ඇතිවීමට බලපෑ හැකි ස්වභාවික සංසිද්ධියකි ................................................ (ලකුණු 05)

**B.** පහත සඳහන් ප්‍රකාශයන් නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද වරහන් තුළ යොදන්න

i. ලීෂ්මානියාව ප්‍රොටෝසෝවාවෙකු මගින් බෝවන රෝගයකි. ( )

ii. මොලුස්කා වංශයේ සියලුම සතුන් බාහිර කවච දරයි. ( )

iii. ශාක පත්‍ර මත ඇති ඝණකම ඉටි උච්චර්මය මගින් අරලියා ශාකය උත්ස්වේදනය අවම කරගනියි. ( )

iv. කහ පැහැයට හුරු මූලද්‍රව්‍යයක් වන ගෙන්දගම් අලෝහයකි. ( )

v. විද්‍යුත් ධාරාවක් ගලායන සම්මත දිශාව ලෙස සලකනු ලබන්නේ ධන අග්‍රයේ සිට ඍණ අග්‍රය දක්වායි. ( )

vi. දේහයේ සමතුලිතතාවය පාලනය කිරීම අනුමස්තිස්කය සතු කාර්ය භාරයකි. ( )

(ලකුණු 06)

Learning Resource Centre
R
De Mazenod College
Kandana